" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/02 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2020.05. 14 |
|---|---|---|---|---|---|

**බස්නාහිර පළාත්**

**ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2020**

බස්නාහිර පළාතේ,
**සියළුම ලේකම්වරුන්,**
**පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන වල**
**සභාපතිවරුන් වෙත.**

**කොරෝනා වෛරසය හේතුකොට ගෙන උද්ගතවී ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රාජ්‍ය ව්‍යාපාර සේවකයින්ගේ ණය පොලිය සඳහා සහන කාලයක් ලබා දීම.**

උක්ත මැයෙන් යුතුව භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2020.03.30 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 02/2020 හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා එවමි.)

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2 හා 2020.05.14 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 30 .03.2020

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක : PED 02/2020

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ සියලුම රාජ්‍ය ව්‍යාපාර ප්‍රධානීන්

**කොරෝනා වෛරසය හේතුකොට ගෙන උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රාජ්‍ය ව්‍යාපාර සේවකයින්ගේ ණය සහ පොළිය සඳහා සහන කාලයක් ලබා දීම.**

කොරෝනා වෛරස් ආසාදනය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමත් සමඟම රාජ්‍ය අංශයේ සේවය කරනු ලබන සේවකයින් වෙත ඇති වී ඇති අපහසුතාවයන් අවම කිරීම උදෙසා රජය විසින් මේ වන විටත් විවිධ සහනයන් ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව, රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවයේ නියුතු සේවකයන් වෙතද සහනයක් ලබා දීමේ අරමුණින් එහි සේවකයන් වෙත ඔවුන්ගේ වැටුපෙන් අඩුකර ගැනීමේ පදනම මත ආයතනයන් විසින් මූල්‍ය පහසුකම් සපයා ඇත්නම් ඒ සඳහා අප්‍රේල් සහ මැයි යන මාසවල වැටුපෙන් අය විය යුතු වාරික සහ පොළිය අය නොකිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

කොරෝනා වෛරසය හේතුකොටගෙන ජනාධිපති කාර්යාලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ට සමගාමීව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

එස්.ආර් ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:- 1) ජනාධිපති ලේකම්
2) අග්‍රාමාත්‍ය ලේකම්
3) අමාත්‍ය මණ්ඩල ලේකම්
4) විගණකාධිපති